# උගුලක අසුවූ

# ඇත් පැටියා



ස්වේන්ද්‍රනී හිමායා වීරසූරිය
5 - B
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

# උගුලක අසුවූ

# ඇත් පැටියා

ස්වේන්ද්‍රනී හිමායා වීරසූරිය
5 - B
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

**උගුලක අසුවූ ඇත් පැටියා**

ප්‍රථම මුද්‍රණය - 2023

ස්වේන්ද්‍රනී හිමායා වීරසූරිය

ISBN - 978-624-206-943-2

**මහාමායා බාලිකා විද්‍යාලයේ සියළුම ගුරු භවතුන් වෙත ගෞරවයෙන් පුද කර සිටිමි.**

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01



එකෝමත් එක කාලෙක පුංචි ඇත් පැටවෙක් එයාගේ අම්මා සහ තාත්තාත් එක්ක සතුටින් ජීවත් වුනා. එයා වැඩිපුරම කැමති උනේ පළතුරු ජාති කන්නටයි . අම්මයි , තාත්තයි කැලේ තියන කොළ ජාති කන්න කියලා එයාට කොච්චර කිව්වත් , එයා හැමදාමත් කරදර කලා පළතුරු කන්න ආසයි කියලා . ඉතින් අම්මටයි තාත්තටයි දරුවාගේ ඉල්ලීම හරිම කරදරයක් උනා . මොකද කැලේ ඇතුලේ පළතුරු ජාති තියෙන්නේ බොහොම ටික කාලෙකට විතරයි . ඒ වගේම රිලව් , වඳුරො , කුරුල්ලො වගේ සත්තු ගොඩක් දෙනා ඒ පළතුරුවලට ආස හින්ද , අලින්ට කන්න පළතුරක් ඉතුරු වෙන්නේ හරිම කලාතුරකින් .

ඇත් පැටියගේ කරදරේ හින්ද , තාත්තා සතියකට දවසක් විතර කැලේ ඇතුලේ හුඟක් දුරට ඇවිදගෙන ගිහිල්ලා , කැලේ මායිමේ තිබුනු හේනකින් පැණිකොමඩු ගෙඩියක් කඩාගෙන ඇවිත් ඇත් පැටියට කන්න දුන්නා .


අම්ම ඒත් තාත්තටත් බැන්නා ''ඔයා තමයි මෙයා නරක් කරන්නෙ. හේන් වල තියන පළතුරු කඩන්න ගිහිල්ලා මිනිසුන්ගෙන් වෙඩි කන්නත් වෙයි'' කියලා .

තාත්ත ඒත් ඇත් පැටියට තියන ආදරේ හින්ද සතියකට දවසක් මොනවහරි පළතුරක් අරන් එනවා . අම්මත් කැලේ පුරාම ඇවිදල පළතුරු හොයන් එනවා , ඇත් පැටියට කන්න දෙන්න .

ඒත් දැන් සති දෙකකින් විතර , ඇත් පැටියට දෙන්න කිසිම පළතුරක් තාත්තටත් අම්මටත් හම්බඋනේ නැහැ . රෑ නිදාගන්න ගියපු වෙලාවෙත් ඇත් පැටියා ''මට හෙට නම් මොනව හරි පළතුරක් හොයල ඕනෙ . නැත්නම් මම කොහේ හරි යනව පළතුරු තියන පළාතක් හොයාගෙන'' කියලා , අම්මටයි තාත්තටයි දුකෙන්ම කිව්වා .

ඇත් පැටියට නින්ද ගියායින් පසුවත් අමමයි , තාත්තයි දෙන්න මේ ගැන හුඟක් වෙලා කතා කරමින් හිටියා . ඒත් ඒ දෙන්නටත් කිසිම විසඳුමක් කල්පනාවට ආවේ නැහැ .


''අපි අර ඈත තියන හේන පැත්තටවත් ගිහින් බලමුකො මොනවහරි පළතුරක් තියෙයි'' කියමින් තාත්තත් , අම්මත් නින්දට ගියා .



පහුවදා උදෙන්ම අවදි උන මේ පුංචි ඇත් පැටවා එයාගේ අම්මත් , තාත්තත් එක්ක කෑම සොයාගෙන කැලේ ඈතට ඇවිදගෙන ගියා . වෙනදාට වඩා ගොඩක් දුර ඇවිදගිය මේ තුන් දෙනාටම ගොඩක් මහන්සි දැණුනා . අම්මත් තාත්තත් කොළ වර්ග කාල වතුර බිලා ටිකක් ගිමන් අරින්න හැදුවත් ඇත් පැටියා ඒකට කැමති උනේ නැහැ . එයාට ''මොනවහරි පළතුරක් කන්නට ඕන'' කියමින් වෙනදා වගේම කරදර කරන්නට උනා .

ඇවිදගෙන යද්දි අද අම්මගේ කකුලේ කටුවකුත් ඇණුනා . තාත්ත හොඬ වැලෙන් ඒක ගලවල දාද්දිත් ඇත් පැටියා ''නවතින්න නම් බෑ . මට අදනම් මොනවහරි පළතුරක් ඕනමයි'' කියා කිව්වා .

ඒ වෙලාවේදි තාත්තා ඇත් පැටියට සැර උනා . ''පළතුරු හොයාගන්න නැහැ කියලා ඔයා දන්නවානේ . මම හෙටවත් ඔයාට මොනව හරි පළතුරක් ගෙනත් දෙන්නම්'' කියමින් තාත්තා ගිමන් හරින්නට උනා . අම්මත් ඒ අසලින්ම ඉඳගත්තා .



ඇත් පැටියා තරහින් වගේ ඒ දෙදෙනාගෙන් වෙන් වෙලා ඇවිදගෙන ගියා . ''ඔයා ඔය කොහේද යන්නෙ . හොඳ ළමයා වගෙ මෙන්න මෙහෙන් ඉන්න . අපි ටිකක් විවේක අරගෙන පස්සේ යමු පළතුරු හොයන්න'' කියල අම්මා බැගෑපත් වෙලා කිව්වා .


ඒත් ඇත් පැටියා අම්මාගේ කතාව ඇහුනෙ නෑ වගේ දිගටම ඇවිදගෙන ගියා . ''කමක් නෑ එයාට ටිකක් දුර යන්න අරින්න . ගිහිල්ල ආපහු එයි'' කියලා තාත්ත කිව්වා . ඇත් පැටියා ඈතට ඇවිදගෙන යනවා තාත්ත බලන් හිටියා .

''ඔයාගේ කකුල රිදෙනව නේද කෝ බලන්න'' කියලා අම්මාගේ කකුලේ කටුවක් ඇණුනු තැන බැලුව තාත්තා , ''අපි අද රෑ මෙහෙ නැවතිල හෙට උදේම ආපහු යමු'' කියල කිව්වා .

මේ අතරෙ ඇත් පැටියා හුඟ දුරක් ඇවිදගෙන ගියා . එයාට දුර ගැන එච්චර දැණුමක් තිබුනේ නැහැ . ''මම බය නෑ . තාත්තයි අම්මයි දෙන්නම ලඟ පාතම ඇති . කොහොම හරි පළතුරක් හොයාගෙන ඒ දෙන්න ගාවටම ගෙනියලා කනවා'' කියා හිතමින් ඇත් පැටියා බොහෝ දුර ඇවිද ගෙන ගියා .

ඉර බැහැගෙන යන බවත් ඇත් පැටියට පෙණුනා . ඒත් ඈතින් ලොකු පැණි කොමඩු තියන හේනක් පෙණුනු නිසා , ඇත් පැටියා නොනැවතීම ඒ පැත්තට ඇවිදගෙන ගියා . ''තාත්තයි , අම්මයි දෙන්නට පෙන්නන්න , ඒ දෙන්න ගාවට වැලක් එක්කම කොමඩු ගෙඩියක් ඇදගෙන යනවා'' කියලත් ඇත් පැටියා හිතුවා . හේන වටේ දඬු වැටක් තිබුණු නිසා , එතන නතර වෙලා අවට බැලූ ඇත් පැටියට හේනේ කිසිවෙකු නැති බව අවබෝධ උනා .

ඒත් ගමේ හේන් වගා කරන මිනිසුන් වන සතුන්ගෙන් වගාව ආරක්ෂා කර ගන්න , උගුල් අටවලා තියෙන බවක් ඇත් පැටියා දැනගෙන හිටියේ නැහැ . හොඳට වැඩුණු ලොකු පැණි කොමඩු ගෙඩියක් කඩාගන්න හොඬය දාල ඇද්දා විතරයි ඇත් පැටියගේ පිටිපස්ස කකුල් දෙකම විශාල කඹයකින් යොදපු උගුලකට හිරඋනා .



එයා පුළුවන් උපරිමයෙන් වෙර යොදා ඇද්දත් උගුලෙන් ගැලවෙන්න ඇත් පැටියට බැරි උනා . එයා මහ හඬක් නගමින් ඇඬුවත් , අම්මටයි තාත්තටයි ඒ හඬ ඇහුනේ නැහැ .

අම්මයි තාත්තයි ගිමන් ඇරලා බලනකොට ඇත් පැටියා නැති හින්දා , ඒ දෙන්නත් හඬ නගමින් හෙව්වත් ඇත් පැටියා හම්බඋනේ නැහැ . උගුලට හිරඋනු ඇත් පැටිය ඒකෙන් ගැලවෙන්නට කොපමන උත්සාහ කලත් , ශක්තිමත් කඹ වලින් ගැලවෙන්නට එයාට පුළුවන් උනෙත් නැහැ .

ඇත් පැටියාට දින තුනක්ම කෑමත් වතුරත් නැතුව හඬමින් හේන අසලම ඉන්නට සිදූ උනා . මේ අතර වෙනත් හේනක එලවළු කැඩිමට පැමිණි පුංචි ගැහැණු ළමයෙකු උගුලට අසුව සිටින ඇත් පැටියා දැක්කා . උගුලෙන් ඇත් පැටියා බේරා ගන්නට මේ ගැහැණු ළමයා එයාගේ තාත්තා හේනට කැඳවාගෙන ආවා .

පුංචි ගැහැණු ළමයා සහ එයාගේ තාත්තා ඇත් පැටයාට ලංවී උගුලේ කඹ කපා දැම්මට උත්සාහ කලත් , එම දෙදෙනාටද එය සිදූ කිරීමට නොහැකි උනා .

මේ දෙදෙනා වවුනියාව ප්‍රදේශයේ පිහිටි ඔවුන්ගේ ගමට ගොස් , යුද හමුදා සිංහ රෙජිමේන්තුවේ කඳවුරු භාර නිලධාරී වෙත ඇත් පැටියා පිළිබඳ විස්තර දැන්වූවා . යුද හමුදා නිලධාරීන් කඩිනමින් එහි ගොස් උගුලේ කඹ කපා ඇත් පැටවා ඉන් මුදවාගෙන , උගුලේ හිරවීමෙන් ඇතිවූ තුවාල වලට ප්‍රතිකාර ලබා දෙන්නටද කටයුතු කලා .

ඇත් පැටවාට වතුර සහ පළතුරු ගොඩක් ගෙනත් දෙන්න හමුදා නිලධාරීන් කටයුතු කලා . දින දෙක තුනක් වතුරත් කෑමත් නැතිව බඩගින්නේ හිටපු ඇත් පැටියාට , කෑම දෙනගමන් එයාව යාළු කරගන්න හමුදා නිලධාරීන්ට හැකි උනා . ඇත් පැටියාගේ අම්මත් , තාත්තත් ඉන්න තැනක් හොයාගන්නට හමුදා නිලධාරීන් බොහෝ උත්සාහ කලත් එය සාර්ථක උනේ නැහැ .

හමුදා කඳවුරට ඇත් පැටියා රැගෙන ගොස් ප්‍රතිකාර ලබා දුන්නත් , පුංචි ඇත් පැටියාගේ ජීවිතය ආරක්ෂා කරගන්න නම් පශු වෛද්‍ය ප්‍රතිකාර ලබාදිය යුතු බව හමුදා නිලධාරීන්ට පෙනීගියා . දින දෙකක් පමන ගත වන විට ඇත් පැටියා හමුදා කඳවුරේ නිලධාරීන් සමඟ හුඟක් යාලු උනා . ගම්මානයේ ජීවත්වූ අයත් කඳවුරේ හැමෝමත් ඇත් පැටියට ආදරේ කලා . දෙමාපියන්ගෙන් මඟහැරුණු මේ ඇත් පැටියත් එයාව උගුලෙන් ගලවගත් මිනිසුන්ට ආදරේ කරන්නට පටන්ගත්තා .



## <u>පසු සටහන</u>

*උගුලේ කඹ වලට සිරීමෙන් ඇත් පැටියාගේ ඇගේ ඇතිවූ ලොකු තුවාල සුව කල යුතු නිසා , හමුදා නිලධාරීන් පිරිස විසින් යුද හමුදා ට්‍රක් රථයක ඇත් පැටියා නංවාගෙන පේරාදෙණිය වෙත රැගෙනවිත් පශු වෛද්‍ය ප්‍රතිකාරයන්ද ලබා දීම සිදුකර ඇත . ඇත් පැටියාට සුවවීමෙන් පසුව , මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ ඇත් පන්තියට ඇත් පැටියා භාර කිරීමද ඉන් පසුව සිදුකර ඇත.*

*මේ ඇත් පැටියා දැන් ලොකු වෙලා , එයාගේ වයස 32 කටත් වඩා වැඩියි .* ***ශ්‍රී දළදා මාලිගාවේ පෙරහැර කරඬුව වඩම්මවන එයාගේ නම තමයි ''සිංහ රාජා''.***

*1978 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලය තුල ශ්‍රී ලංකාවේ පැවතුණු ත්‍රස්තවාදී යුද්ධය අතරතුර කාලයේ : 1992 වර්ෂයේදී නැගෙනහිර පළාතේ වවුනියාව ප්‍රදේශයේ ආරක්ෂාව සඳහා සේවයේ යොදවා සිටි 2 - ශ්‍රී ලංකා යුද හමුදා සිංහ රෙජිමේන්තුවේ නිලධාරී අණදෙනවරයෙකු වශයෙන් එවකට සේවය කර , මේවන විට විශ්‍රාමිකව සිටින මගේ සීයා බ්‍රිගේඩියර් උපතිස්ස සේනාරත්න විසින් මට කියාදුන් :*

> ***''උගුලකට අසුවී තුවාල ලබාසිටි ඇත් පැටවෙකු ඉන් බේරා ගෙන ප්‍රතිකාර ලබාදුන් බවත් , වවුනියාවේ සිට මහනුවර දක්වා කිලෝ මීටර 180 පමන දුරක් , බොහෝ අපහසුතා මැද ට්‍රක් රථයකින් එම ඇත් පැටියා රැගෙන ආ බවත් , දෙමාපියන්ගෙන් මඟ හැරුණු මේ ඇත් පැටියාට ප්‍රතිකාර ලබාදී , ශ්‍රී දළදා මාලිගාවේ ඇත් පන්තියට භාරදුන් බවත්''***

*යන සත්‍ය සිදුවීමේදී ,* ***ඇත් පැටියා ගේ අත්දැකීම් පිළිබඳ මගේ කථාව*** *ඔබ සැමගේ දැන ගැනීමට පෙර පිටුවල සඳහන් පරිදි ඉදිරිපත් කරමි .*





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . :

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01